# මෝගල් සිතුවම්හි සත්ත්ව රූප භාවිතය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ආර්.එල්.ඩී. රසාදිකා, පී.එ.එස්.ඩී.පද්මපෙරුම, පී.ඒ.වයි.ආර්.කුලතුංග*

භාරතයේ බිහි වූ අධිරාජ්‍යයන් අතර මෝගල් රාජ්‍යට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ඒ අනුව මෝගල් අධිරාජ්‍ය යටතේ මෝගල් කලාව ප්‍රභවය වන්නේ වර්තමාන ඉරානය ලෙසින් හඳුන්වන පර්සියානු දේශයේ ය. මොන්ගෝලියානු හා මධ්‍ය ආසියානු ලක්ෂණයන්ගෙන් යුතු වූ පර්සියානු මෝගල් කලාව භාරතය තුළ ගොඩනැගෙන්නේ භාරතයට ආවේණික ලෙස වෙනස් වෙමින් ය. ක්‍රි.ව. 16 වන සියවසේ දී පමණ වයඹදිග ඉන්දියාවේ කන්දහාර් අගනුවර කර ගනිමින් ගොඩනැගුණු මුගල් අධිරාජ්‍ය ඉන්දියාවේ දිල්ලි සුල්තාන් අධිරාජ්‍ය බිඳ වැටීමත් සමග මධ්‍ය ආසියාවේ සිට ඉන්දියාවට පැමිණි මුස්ලිම් රාජ වංශයකි. මෙම පාලන සමයෙහි විශිෂ්ටත්වය විදහා දක්වන එක් අවස්ථාවක් වුයේ පර්සියන් හා භාරතීය ලක්ෂණ එක් කොට සැදුම් ලත් මුගල් සිතුවම් කලාවයි. හුමායන් රජ දවස මුගල් සිතුවම්හි ආරම්භය සිදුවිය. පසුව බලයට පැමිණි අක්බාර් රජු සමයේ මෝගල් කලාව ස්ථාවර විය. මෝගල් සිතුවම්හි විශේෂ ලක්ෂණ වුයේ ඒවා ලෞකික සිතුවම් විනා ආගමික සිතුවම් කලාවක් වර්ධනය නොවීමයි. සෑම රජ කෙනෙකුම තමන්ගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් සිතුවම් කර ඇත. ආරම්භයේ ගෘහ අලංකරණය සඳහා භාවිත වූ සිතුවම් පසුව අලේඛ්‍ය සිතුවම් ඇඳීම සහ පොත්වල සිතුවම් ඇඳීම දක්වා ප්‍රචලිත විය. රාජකීයයන්, විවිධ සිද්ධි, වෘක්ෂලතා, වනසතුන් විෂය කරගත් මෙම සිතුවම්හි නිරූපිත සත්ව රූප සිතුවම් වලට භාවිත කර ඇති අන්දම විමසා බැලීම මෙහි අරමුණ වේ. මේ සඳහා මූලාශ්‍ර පරිශීලනය කිරීම හා මුගල් සිතුවම් නිරීක්ෂණය කිරීම අධ්‍යන ක්‍රමවේදය ලෙස භාවිත විය. ඉන්දියාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්, රාජ්පුත් සිතුවම්, අජන්තා සිතුවම් ආදී යුගවල සිතුවම් වලට වඩා මෝගල් සිතුවම්වල සත්ත්වයින් යොදා ගැනීම ප්‍රබල වී ඇති බව අනාවරණය කර ගත හැකිය. මේවායෙහි යොදාගෙන ඇති සතුන් කවුරුන්ද හා කුමන අරමුණක් පෙරදැරි කරගෙන යොදාගන්නට ද ඇති බව විමසීම මෙහි අපේක්ෂාව වේ.

ප්‍රමුඛ පදඃ මෝගල්, සිතුවම්, සත්ත්ව රූප, කලාව, භාරතය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය rasadikadilhani123@gmail.com